වාර්ෂික වාර්තාව

2010/2011

LLTL

සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම

<u>පටුන</u> <u>පිටුව</u>

දැක්ම සහ මෙහෙවර... 3

සංස්ථාමය තොරතුරු... 6

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය........ 7

සභාපතිගේ සමාලෝචනය.. 8

ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය............................ 9

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය.. 11

විශේෂ මූල්‍ය සිදුවීම්.. 11

අධ්‍යක්ෂ මණ්ඩලය 12

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව.. 12

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම............... 17

දැක්ම

- ප්‍රසම්පාදනය සහ ව්‍යාපෘති සඳහා ආදර්ශවත් පහසුකම් සැපයීම මගින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම

මෙහෙවර

- බාහිර රහස්‍ය බව සහ අභ්‍යන්තර පාරදෘශ්‍යබව පවත්වා ගනිමින් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට, පොලීසියට සහ රජයට අයත් අනෙකුත් ආයතනවලට විදේශ රාජ්‍යයන්ට අයත් සංවිධාන සහ නිෂ්පාදකයන්ගෙන් කඩිනම් ආකාරයෙන් සීමිත සහ උපාය මාර්ගිකව වැදගත් හමුදා උපකරණ ප්‍රසම්පාදනය සඳහා පහසුකම් සැපයීම

- දේශීය ආරක්ෂක කර්මාන්තය ප්‍රවර්ධනය සහ එහි පර්යේෂණ සහ සංවර්ධනය සඳහා සහාය වීම

- ජාතික ආරක්ෂක ගම්‍යතාවන් සහිත ව්‍යාපෘති ආරම්භ කිරීමට/ සිදු කිරීමට භාරගැනීම සහ කළමනාකරණය කිරීම

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ විෂයපථය යටතේ ඇති ආයතනවලට හමුදාමය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයට පහසුකම් සැපයීමේ අරමුණ ඇතිව ස්ථාපිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම ශ්‍රී ලංක රජයට පූර්ණ අයිතිය ඇති අස්තිත්වයකි. අතිගරු ජනාධිපතිතුමන්ගේ සහ ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්තුමාගේ දුරදර්ශී දැක්මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ආරක්ෂක ප්‍රසම්පාදන කටයුතු සඳහා පහසුකම් සැපයීම පිණිස සම්පූර්ණයෙන්ම රජයට අයත් සංවිධානයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව මත මෙම සමාගම පිහිටුවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2006 මාර්තු 29 දිනැති (යොමු : 06/0650/206/025) අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව 2006 සැප්තැම්බර් 04 දින සංස්ථාගත කරනු ලැබූ අතර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2010 සැප්තැම්බර් 01 වන දින නැවත ලියාපදිංචි කරන ලදී.

- අද වන විට සමාගමේ විෂය පථය හමුදාමය භාණ්ඩ සඳහා පහසුකම් සැපයීමෙන් ඔබ්බට ගොස් ජාතික ආරක්ෂක ගම්‍යතාවන් සහිත රාජ්‍ය ආරක්ෂාව ආශ්‍රිත ව්‍යාපෘති දක්වා ව්‍යාප්තව තිබේ. මෙලෙස සිදුකරනු ලබන ව්‍යාපෘතින් ප්‍රධාන වශයෙන් කාණ්ඩ තුනකට බෙදේ. දේශීය වශයෙන් රාජ්‍ය ආරක්ෂාවට සම්බන්ධ කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා රජයේ ව්‍යාපෘති (පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය හරහා වැඩි දියුණු කළ නිපැයුම්)
- ජාතික ආරක්ෂක ගම්‍යතාවය සහිත ව්‍යාපෘති (ල.ලො.ටෙ.ස. හරහා)
- සිවිල් ව්‍යාපෘති සඳහා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව

ඉහත කාණ්ඩ යටතේ ල.ලො.ටෙ.ස. සැලසුම් කර ආරම්භ කරන ලද ප්‍රධාන ව්‍යාපෘති

- රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලය සහ ආරක්ෂක හමුදා මූලස්ථානය පුනස්ථාපනය
- ජාතික පුද්ගල ලේඛනය / විද්‍යුත් ජාතික හැඳුනුම්පත
- පොලිස් මූලස්ථාන සංකීර්ණය පුනස්ථාපනය
- හමුදා ශ්‍රේණියේ පාවහන් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම
- ද්විත්ව අගනගර සංවර්ධනය කිරීම
- උතුරු සහ නැගෙනහිර සඳහා සම්ප්‍රේෂණ කුළුණු ජාලය
- වාණිජ පුපුරන ද්‍රව්‍ය කම්හලක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම
- කුඩා අවි ආයුධ සහ පතරොම් නිෂ්පාදන කම්හලක් ස්ථාපිත කිරීම
- ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සඳහා සෞඛ්‍යාරක්ෂණය මධ්‍යගත කිරීම
- ගුවන් බෝම්බ කම්හලක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම
- පරාඝාත රණවිරුවන් සඳහා දිගුකාලීන සත්කාරක මධ්‍යස්ථානය (සම්පූර්ණයෙන්ම පාහේ සම්පූර්ණ කර තිබේ)

- කලාපීය අධ්‍යක්ෂක මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
- ඒ 320 විඩම්බන පාදක වර්ගයේ ශ්‍රේණිගත කරීමේ සංවිධානයක් පිහිටුවීම
- සමුද්‍ර නගර ව්‍යාපෘතිය
- ෆ්ලෙයාර් පෙලම් වර්ගයේ උණ්ඩ නිපදවීමේ කම්හලක් ස්ථාපිත කිරීම
- ආරක්ෂක කර්මාන්ත උද්‍යානයක් ස්ථාපිත කිරීම
- ඌව වෙල්ලස්ස සහ බුත්තල විශ්වවිද්‍යාල පුළුල් කිරීම

සමාගමේ නම	:	සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම
නෛතික තත්ත්වය	:	සීමිත ආධිනතා සමාගමකි
ලියාපදිංචි කාර්යාලය	:	4 – 205, බී.එම්.අයි.සී.එච්, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
සංස්ථාගත කළ දිනය	:	2006 සැප්තැම්බර් 04
සමාගමේ ලියාපදිංචි අංකය	:	N(PBS) 1331
අධ්‍යක්ෂ මණ්ඩලය	:	එන්. පෙරේරා මහතා - සභාපති එල්. ආර්. ද සිල්වා මහතා - අධ්‍යක්ෂ වසන්ත ඒකනායක මහතා අධ්‍යක්ෂ එල්. එන්. ද සිල්වා චන්ද්‍රසේන මිය- අධ්‍යක්ෂ/ ලේකම් එස්. සේනාරත්න මහතා- අධ්‍යක්ෂ
ලේකම්	:	එල්. එන්. ද සිල්වා චන්ද්‍රසේන මිය 383, කෝට්ටේ පාර, රාජගිරිය. දුරකථන 011 – 2868793
විගණකවරු	:	බී. ආර්. ද සිල්වා සහ සමාගම (වරලත් ගණකාධිකාරීවරු 22/4, විජය කුමාරතුංග මාවත, කොළඹ 05. දුරකථන : 011/4510368 / 011 – 4510268
බැංකුකරුවෝ	:	ලංකා බැංකුව නිදහස් චතුරස්‍ර ශාඛාව ටොරින්ටන් කොළඹ 07. දුරකථන : 011 – 2678073



වසර තිහක දීර්ඝ කාල පරාසයකින් පසු ත්‍රස්තවාදයෙන් තොර යුගයක් අප රටෙහි උදා වී තිබේ. දේශපාලන නායකත්වය, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් සහ පොලිසියේ අති විශිෂ්ඨ කැපවීම සහ බැඳීම හේතු කොට ගෙන මෙම ත්‍රස්තවාදී ව්‍යසනය සාර්ථකව තුරන් කිරීමට හැකි වුණි. මෙම අභියෝගාත්මක කාර්යයේදී ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට හමුදාමය භාණ්ඩ / සේවා සහ හමුදා බල ඇණි සඳහා අවශ්‍ය සැපයුම් ලබාදීම මගින් තීරණාත්මක භූමිකාවක් ල.ලො.ටෙ. සමාගම ඉටු කරන ලදී.

දැඩි කැපකිරීම් මධ්‍යයේ දිනාගත් සාමය තිරසාරව පවත්වාගැනීම සඳහා ඔබේ අඛණ්ඩ සහයෝගය යෝධ ශක්තියක් වනු ඇතැයි මගේ විශ්වාසයයි. දැන් යුද්ධය අවසන්ව ඇති බැවින්, ඉදිරි අනාගතයේදී ඔබේ විෂයපථය පුළුල් කිරීම අතිශයින්ම වැදගත්ය. සාර්ථකත්වයේ හිණිපෙත්තට පියමං කිරීමේ ලං.ලො.ටෙ. සමාගමේ ප්‍රයත්නය සාර්ථක වේවා යැයි මම ඉත සිතින් සුබ පතමි.

සභාපතිගේ සමාලෝචනය

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා, පොලිසිය ඇතුළු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට හමුදාමය භාණ්ඩ සහ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා පහසුකම් සැපයීමට ස්ථාපිත කරන ලද සමාගමක් වශයෙන් මෙරටින් ත්‍රස්තවාදය තුරන් කරලීම සඳහා අපට සරල එහෙත් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට තිබුණි. දශක තුනක් මුළුල්ලේ පැවති විනාශකාරී යුද්ධයේ අවසානය අප දුටුවෙමු. අතිශයින් දුෂ්කර වූ මෙම කාර්යයේදී අපේ භූමිකාව ඉටු කිරීමට හැකි වීම පිළිබඳව අප නිහතමානීව සතුටු වන්නෙමු.

රජයන් සහ රජයන් අතර පදනමකින් හමුදා ප්‍රසම්පාදන ක්ෂේත්‍රය සඳහා අපගේ ප්‍රවිශ්ඨය, මෙම ගනුදෙනුවලදී තෙවැනි පාර්ශ්වයන් / නියෝජිතයන් බැහැර කරලීමෙහිලා වැදගත් භූමිකාවක් ඉටු කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රජයට සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ඉතිරි කර දීමට අපට හැකි විය. අපගේ ප්‍රධාන අරමුණ මේ වන විට සාක්ෂාත් කරගෙන ඇති බැවින්, අප දැන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය ඉටු කරන ව්‍යාපෘතීන්ට පහසුකම් සැපයීමේ කාර්යයේ නියුක්ත වී සිටින්නෙමු.

ල.ලො.ටෙ. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයටත් ප්‍රධාන විධායක නිලධාරී ජයන්ත වික්‍රමසිංහ මහතාටත්, කාර්ය මණ්ඩලයත් ඔවුන්ගේ නොසැලෙන සහයෝගය සහ කැපවීම වෙනුවෙන් මගේ ප්‍රශංසාව පල කරමි.

පසුබිම

උතුරු නැගෙනහිර මානුෂීය මෙහෙයුම ආරම්භයත් සමග, තෙවැනි පාර්ශ්වයන් වැලැක්වීම සඳහා රජයන් සහ රජයන් අතර පදනමක් මත හමුදා ප්‍රසම්පාදන සිදුකිරීම පිණිස සම්බන්ධීකරණ ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව මතු විය. මෙම සම්බන්ධය සැපයීම සඳහා ල.ලො.ටෙ. ස. ආරම්භ කිරීම උපකාරක විය. මෙම උතුම් මෙහෙවරෙහි අප නිරත වූයේ ගැටුමින් තොර සාමකාමී රටක් දැකීමේ අභිලාෂයෙනි. මෙම සිහිනය දැන් යථාර්ථයක් බවට පත් ව ඇති අතර එම කාර්යයේදී අපේ භූමිකාව ඉටු කිරීමට හැකිවීම පිළිබඳව අප නිහතමානීව ආඩම්බර වන්නෙමු.

අප දැනටමත් අපගේ විෂයපථය ව්‍යාප්ත කරමින් වඩා පුළුල් සීමාවකට ළඟා වී ඇති අතර ජාතික ආරක්ෂක ගම්‍යතාවන් සහිත වාණිජ ව්‍යාපෘති සහ ව්‍යාපාරයන්හි වඩ වඩාත් නිරත වීමට අදහස් කරන්නෙමු. කළල අවධියේ සිට මේ දක්වා වූ අප ගමන් මග තුළ අපි වැදගත් සන්ධිස්ථාන ගණනාවක් පසුකර ඇත්තෙමු. එහෙත් අපට ළඟා කර ගැනීමට තවත් බොහෝ දේ ඇති අතර එළඹෙන වසර කිහිපය තුළ සිය පූර්ණ විභවය සාක්ෂාත් කරගැනීම ල.ලො.ටෙ. සමාගමට හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි.

මූල්‍ය කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 7.6 ක බදු වලින් පසු ලාභයක් වාර්තා කළ අතර එය 2009/10 වසරේ ලාභය වූ රු. මිලියන 2.0 හා සැසඳීමේදී සැලකිය යුතු වැඩිවීමකි. සිය ව්‍යාපාරික ජීවන චක්‍රයේ මුල් අවධියේ සිටින සමාගමක් ලෙස, එය දැන් සිටිනුයේ වර්ධන අවධියේය. 2009/10 වසරේ අනුපාතිකයන් වූ 17%, 12%, සහ 5% හා සැසඳීමේදී දළ ලාභ අනුපාතිකය, මෙහෙයුම් ලාභ අනුපාතිකය සහ ශුද්ධ ලාභ අනුපාතිකය අනුපිලිවෙලින් 73%, 24% සහ 17% දක්වා වැඩි වී තිබේ.

වර්තමාන මෙහෙයුම්

සමාගම වත්මනෙහි සන්නද්ධ හමුදා අවශ්‍යතා සඳහා ප්‍රසම්පාදන පහසුකම් සැපයීමේ නිරතව සිටී. චීන මහජන සමූහාණ්ඩුවේ රජයට අයත් සමාගම් සමග අත්සන් තබන ලද මූලික ගිවිසුම් හරහා තොග සම්පූර්ණ කිරීම පිණිස ආයුධ සහ උණ්ඩ ප්‍රසම්පාදනයට අමතරව, රුසියානු ණය ආධාර සහ ඉන්දීය ණය ආධාර වැඩසටහන් හරහා මූල්‍යාධාර සපයන සන්නද්ධ හමුදා ප්‍රසම්පාදන අවශ්‍යතාවන්හි ප්‍රසම්පාදන පහසුකම් සැපයීමේද සමාගම නිරතව සිටී. සැපයුම්කරුවන් විසින් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී ඉලෙක්ට්‍රොනික ලංසු ඉදිරිපත් කිරීම (ESB) හඳුන්වා දීම සඳහා කටයුතු කිරීමට අප පළමු පියවර ගෙන ඇත්තෙමු.

ව්‍යාපෘති කළමනාකරණය

අකුරේගොඩ ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීමේදී ව්‍යාපෘති කළමනාකරුගේ කාර්යභාරය අප ලබාගෙන ඇත්තෙමු. එයට අමතරව පහත දැක්වෙන ව්‍යාපෘතිවල ද ව්‍යාපෘති කළමනාකරුවන් වන්නේ අප ය.

- මිරිහාන සහ නාරාහේන්පිට පොලිස් මූලස්ථාන සංකීර්ණය ඉදි කිරීම
- පුරවැසි දත්ත විද්‍යුත් ගබඩා කිරීම සහ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ජාතික පුද්ගලරෙජිස්ට්‍රාර් කාර්යාලයක් ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘති කළමනාකාරණ කාර්යයන්ට අමතරව, රාජ්‍ය - පෞද්ගලික අංශ හවුල්කාරිත්ව පදනමින් හමුදා ශ්‍රේණියේ පාවහන් නිෂ්පාදන කම්හලක් ඉදිකිරීම සඳහා ද අප කටයුතු කරන්නෙමු.

එසේම ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයට සැපයුම්දාම සහයෝගයද අප ලබා දෙන්නෙමු.

අනාගත සැලසුම්

දැනටමත් අප සාක්ෂාත් කරගෙන ඇති දෑ ශක්තිමත් කරන අතරතුර, රාජ්‍ය සහ පුද්ගලික ආයතන අභිබවා තරඟකාරිත්ව වාසිදායක තත්ත්වයක් ඇති කරගැනීම පිණිස සංවිධානයේ මානව සම්පත් ඉහළ නැංවීම සහ වැඩි දියුණු කිරීම පිණිස, ලං.ලො.ටෙ. සමාගම පුළුල් කිරීමට අවශ්‍ය පියවර දැන් ගනිමින් පවතී. ජාතික පුද්ගල රෙජිස්ට්‍රාර් දත්ත ගබඩා කාර්යාලය, විදත් වාණිජ කටයුතු (e-commerce) සඳහා විදත් දත්ත අන්තර් හුවමාරුව බඳු ජාතික ආරක්ෂක ගම්‍යමාන සහිත ව්‍යාපෘති සඳහා රජය (ල.ලො.ටෙ.ස.) සහ විදේශීය උපායමාර්ගික / තාක්ෂණික පාර්ශ්වකරුවන් සමග ඒකාබද්ධ ව්‍යාපාර ඇති කිරිමට අප කටයුතු කරමින් සිටින්නෙමු. ඒ අතරම, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව දේශීය ආරක්ෂක කර්මාන්තයක් ස්ථාපිත කිරීමට සහ සිවිල් ව්‍යාපෘති සඳහා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වයන් ඇතිකරලීමටද අප සැලසුම් සකස් කරමින් සිටින්නෙමු.

ආරක්ෂක ලේකම්තුමාටත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිටත්, ඔවුනගේ මාර්ගෝපදේශනය වෙනුවෙන් මාගේ ස්තුතිය පිරිනමමි. සංවිධානය වෙනුවෙන් උපරිම දායකත්වය ලබා දෙන ල.ලො.ටෙ.ස. කාර්ය මණ්ඩලයට මාගේ විශේෂ ස්තුතිය පිරිනමමි.

ජයන්ත වික්‍රමසිංහ
(ප්‍රධාන විධායක නිළධාරි)

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

ජයන්ත වික්‍රමසිංහ	ප්‍රධාන විධායක නිලධාරී
නිශාන්ත ද සිල්වා	ව්‍යාපෘති සහ මෙහෙයුම් ප්‍රධානී
එස්. මහින්දපාල	ප්‍රසම්පාදන පහසුකම් සහ මූල්‍ය ප්‍රධානී
ධම්මික ප්‍රනාන්දු	ප්‍රසම්පාදන පහසුකම් සහ සැපයුම් දාම ප්‍රධානී
උපුල් ගුණසේකර	ව්‍යාපෘති කළමනාකරු
දමිත ජයකස්කර	ව්‍යාපෘති කළමනාකරු

විශේෂ මූල්‍ය සිදුවීම්

විස්තරය		2011	2010	වෙනස%
ආදායම		46,091,097	40.706,635	13
දළ ලාභය		33,674,766	6.729,253	400
බදුවලට පෙර ලාභය		10,825,165	4.807,488	125
බදුකරණය		-3,176,219	2,771,182.3	15
බදුවලින් පසු ලාභය		7,648,946	2,035,665	276
ජංගම නොවන වත්කම්		4,030,340	8,433,648	-52
ජංගම වත්කම්		132,616,469	137,993,860	-4
මුළු වත්කම්		136,646,809	146,427,507	-7
මුළු ස්කන්ධ		100,947,221	93,298,275	8
ජංගම නොවන බැරකම්		1,870,425	1,331,563	40
ජංගම බැරකම්		33,829,163	51,797,669	-35
ශුද්ධ වත්කම්		100,947,221	93,298,275	8
අනුපාත				
කොටසක් සඳහා ඉපැයුම්	රු.	37,312	9,930.00	276
කොටසක් සඳහා ශුද්ධ වත්කම්	රු.	492,425	455,114	8
ස්කන්ධ මත ලාභය	%	7.58	2.18	247.28
මුළු වත්කම් මත ලාභය	%	7.92	3.28	141.29
දළ ලාභ අනුපාතිකය	%	73.00	17.00	329.41
මෙහෙයුම් ලාභ අනුපාතිකය	%	24.00	12.00	100.00
ශුද්ධ ලාභ අනුපාතිකය	%	17.00	5.00	240.00
ජංගම වත්කම් අනුපාතය (කාල)	%	3.92	1.99	96.98

අධ්‍යක්ෂක මණ්ඩලය

නිමල් පෙරේරා මහතා
ලෙයිෂා එන් ද සිල්වා චන්ද්‍රසේන - අධ්‍යක්ෂ / සමාගමේ ලේකම්
ලලිත් ආර්. ද සිල්වා මහතා
වසන්ත ඒකනායක මහතා
සුදර්ශන සේනාරත්න මහතා

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්තාව සමගින් විගණනය කරන ලද ගිණුම්ද ඒ පිළිබඳ ස්වාධීන විගණන වාර්තාවද අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කරයි.

වර්ෂය සඳහා සමාලෝචනය

අමාත්‍ය මණ්ඩලයේ ගරු අමාත්‍යවරුන්ගේ තීරණය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ සමාගම පහසුකම් සැපයූ ප්‍රසම්පාදන සඳහා රු. මිලියන 189 පරිපාලන ගාස්තු සඳහා හිමිකම් පාමින් නාම මාත්‍ර ඉන්වොයිස් නිකුත් කරන ලදී.

අදාල සන්නද්ධ හමුදා විසින් වෙන් කරන ලද වැය ශීර්ෂ ප්‍රකාරව මෙම කාලසීමාව සඳහා ප.ස. මධ්‍යස්ථානයේ සේවා ගාස්තු ලෙස රු. මිලියන 31.9 ක් අපි පිළිගෙන ඇත්තෙමු.

පෙර වසරේ ඉපැයූ රු. මිලියන 40 ට සාපේක්ෂව රු. මිලියන 46 ක පිරිවැටුමක් වාර්තා කිරීමට සමාගමට හැකි විය. පෙර වසරේ ඉපැයූ රු. මිලියන 2 ට සාපේක්ෂව 2010 / 11 මූල්‍ය වර්ෂයේ ප්‍රතිඵල අනුව රු. මිලියන 7.6 ක බදු වලින් පසු ලාභයක් පෙන්නුම් කරයි. ලාභ වැඩිවීම සඳහා හේතුවූයේ පරිපාලන ගාස්තු ආදායම වැඩිවීමයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

හමුදාමය භාණ්ඩ සඳහා පහසුකම් සැපයීමෙන් ඔබ්බට ගොසින් ජාතික ආරක්ෂක ගම්‍යතාවන් සහිත රාජ්‍ය ආරක්ෂාව ආශ්‍රිත ව්‍යාපෘති දක්වා සමාගමේ කටයුතු ව්‍යාප්ත විය. එම ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදේ.

- සිවිල් ව්‍යාපෘති සඳහා රාජ්‍ය - පුද්ගලික හවුල්කාරී බව
- දේශීය රාජ්‍ය ආරක්ෂාවට සම්බන්ධ කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා රජයේ ව්‍යාපෘති (ල.ලො.ටෙ. සමාගමට අයත් සමාගමක් හරහා)
- රජය (ල.ලො.ටෙ.සමාගම හරහා) සහ විදේශීය උපායමාර්ගික / තාක්ෂණික පාර්ශ්ව අතර ඒකාබද්ධ සමාගම්

ආයතනික පාලනය

උපාය මාර්ගික අරමුණු සකස් කිරීම, නායකත්වය සැපයීම සහ කළමනාකාරිත්වය අධීක්ෂණය ඇතුළුව සමාගම පරිපාලනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

පිරිවැටුම

වසර සඳහා පිරිවැටුම රු. 46,091,097 කි.

ලාභ අලාභ ගිණුම

මූල්‍ය සාරාංශ	**2010/ 11 රු.**	**2009/2010 රු.**
ආදායම	46,091,096.60	40,706,635.00
විකුණුම් පිරිවැය	(12,416,330.54)	(33,977,382.00)
දළ ලාභය	33,674,766.06	6,729,253.00
අනෙකුත් ආදායම	15,823,597.20	34,231,834.00
පරිපාලන වියදම්	(38,494,455.05)	(36,153,599.00)
මෙහෙයුම් ලාභ / (අලාභය)	11,003,908.21	4,807,488
බදු වලින් පසු ලාභය	7,648,945.95	2,035,664.55

ප්‍රාග්ධන වියදම්

වසර තුළ ස්ථාවර වත්කම් අත් කර ගැනීම මත දැරූ මුළු ප්‍රාග්ධන වියදම, පෙර වසෙරෙහි රු. 2,251,088.79 ට සාපේක්ෂව රු. 74,907 ක් විය.

දේපල, පිරියත සහ උපකරණ

සමාගමේ දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි වන සටහනෙහි පෙන්නුම් කර ඇත.

සංචිත

වසර තුළ ප්‍රාග්ධන සහ ආදායම් සංචිත හුවමාරු කිරීමේ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා ඇත.

පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම්

ගිණුම්වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකිරීමට අවශ්‍ය තත්ත්වයන් ශේෂපත්‍ර දිනයෙන් පසුව මතුව නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත නම් සඳහන් සාමාජිකයන් විගණන කමිටුවේ සේවය කරන ලදී.

1. එම්. වසන්ත ඒකනායක මහතා (සභාපති)
2. ලලිත් ආර්. ද සිල්වා මහතා
3. සුදර්ශන සේනාරත්න මහතා

කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳියා

2010/11 මූල්‍ය වර්ෂය තුළ කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු බැඳියාවක් නොතිබුණි.

අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු

වසර තුළ ගෙවන ලද **අධ්‍යක්ෂවරු**වරුන්ගේ ගාස්තුව රු. 610,000 ක් විය.

අධ්‍යක්ෂවරු කොටස් දැරීම

2011 මාර්තු 31 දායින් අවසන් වූ මූල්‍ය කාලසීමාව තුළ අධ්‍යක්ෂවරු සමසාගමේ කොටස් දරනු නොලැබීය

විගණකවරු

පත් කරනු ලැබූ කාලසීමාව අවසන් වූ සහ යළි පත්වීමට සුදුසුකම් ඇති බී. ආර්. ද සිල්වා සහ සමාගම (වරලත් ගණකාධිකාරීන්) විගණකවරුන් ලෙස ඔවුන් යළි පත්කිරීමට සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකය නිශ්චය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරෙන යෝජනාවක් වාර්ෂික මහා සභාවට ඉදිරිපත් කරනු ඇත.

2011 මාර්තු 31 දායින් අවසන් වසර සඳහා පාරිශ්‍රමිකය ලෙස බී. ආර්. ද සිල්වා විගණක සමාගමට රු.107,000/- ක් ගෙවන ලදී.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ ප්‍රමාණයට විගණකට මෙහි ඉහත හෙළිදරව් කර ඇති සබඳතා හැරෙන්නට වෙත් කිසිදු සබඳතාවක් (විගණක ලෙස හැරුණු විට) සමාගම සමග නොමැත. එසේම විගණකට සමාගම කෙරෙහි කිසිදු බැඳියාවක් ද නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන්,

නිමල්. පෙරේරා මහතා
(සභාපති)

ආයතනික පාලන ප්‍රකාශය

සමාගමේ පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර පාලනයේදී කොටස් හිමියන්ගේ වගකීම වනුයේ අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ යෝග්‍ය පාලන ව්‍යුහයක් පවතින බව සහතික කිරීමයි.

ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය සියලු ක්‍රියාකාරකම් වලදී ව්‍යාපාරික විශ්වාසනීයනත්වය සහ වෘත්තියබව සඳහා කැපව සිටී. එම කැපවීමේ කොටසක් ලෙස, ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිති සහ යහපත් පරිචයන් වර්ධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහයෝගය දක්වයි.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම වනුයේ සමාගමේ උපාය මාර්ගික අරමුණු සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම, ව්‍යාපාරයේ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ මහ භාණ්ඩාගාරය වෙත වාර්තා කරීමයි. (පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව)

එසේම , නීති සහ රෙගුලාසි වලට අනුකූල වන්නා වූ ක්‍රියාමාර්ග මගින් කොටස්හිමියන් සහ පරදූ දරන්නන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම සහ අවංකත්වය, පාරදෘශ්‍යභාවය සාධාරණ ගනුදෙනු සහ වගවීමට ප්‍රතිලාභ ලබා දෙන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස් වේ. අවශ්‍ය වූ විටකදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර සමාගමේ තීරණ ගැනීමේ ක්‍රියාදාමය කෙරෙහි බලපාන්නා වූ ස්වාධීන තීන්දු ගැනීමේ හැකියාව තිබේ.

විගණන කමිටු වාර්තාව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන්, එනම් වසන්ත ඒකනායක (සභාපති), ලලිත් ද සිල්වා සහ සුදර්ශන සේනාරත්න යන මහතුන්ගෙන් සමන්විත වේ. විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරයන් සහ වගකීම්වලට පහත කරුණු අයත් වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කිරීම ඇතුළුව සමාගමේ මූල්‍ය වාර්තා සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාදාමයේ ගුණාත්මකබව සහ අවංකවබවට අදාළ අධීක්ෂණ වගකීම් ඉටු කිරීම

(ආ) 2007 අංක 07 දරන සමාගම් පනතේ සහ අනෙකුත් අදාල මූල්‍ය වාර්තාකරණ ආශ්‍රිත රෙගුලාසිවල මූල්‍ය වාර්තාකරණ සහ තොරතුරු අවශ්‍යතා සමග සමාගමේ අනුකූලතාවයට අදාළ අධීක්ෂණ වගකීම් ඉටුකිරීම

(ඇ) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතින්හි අවශ්‍යතා සැපිරීමට සමාගම් අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණය ප්‍රමාණවත් බව සහතික කිරීම පිණිස ඇති ක්‍රියාදාම අධීක්ෂණය පිළිබඳ වගකීම් ඉටුකිරීම සහ නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට සමාගම අනුකූල ව බව සහතික කිරීම

(ඈ) සමාගමේ බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය ඇගයීම

(ඉ) බාහිර විගණකවරුන් පත් කිරීම, යලි පත් කිරීම සහ යෝග්‍ය අවස්ථානුගත තත්ත්වයන් යටතේ ඔවුන් ඉවත් කිරීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම

(ඊ) ව්‍යවස්ථාපිත විගණනය හැරුණු විට සමාගම සඳහා බාහිර විගණකවරුන් විසින් බාරගනු ලබන කිසියම් කාර්යයක සාපේක්ෂ තත්ත්වය (යෝග්‍යතාව) සලකා බැලීම සහ

(උ) බාහිර විගණකවරුන්ගේ පාරිශ්‍රමිකයසහ නියුක්ත කිරීමේ නියමයන් අනුමත කිරීම

2011 මාර්තු 31 දායින් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණන කමිටුව ත්‍රෛමාසිකවම රැස්වන ලදී. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රසම්පාදන පහසුකම් සහ මූල්‍ය අංශ ප්‍රධානීන්ටද රැස්වීම්වලට සහභාගි වීමට විගණක කමිටුව ආරාධනා කළද ඔවුනට රැස්වීමෙන් ඉවත් වන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය කමිටුව සතුව තබාගන්නා ලදී.

සමාලෝචන මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටුව, අනෙකුත් කරුණු අතර පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නියැලෙන ලදී.

- විගණනය නොකරන ලද මාසික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය
- වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා සමාලෝචනය
- බාහිර විගණකවරුන් විසින් නිකුත් කරන ලද කළමනාකරණ ලිපිය සමාලෝචනය සහ කළමනාකරණය පසු විපරම් ක්‍රියාමාර්ග අධීක්ෂණය
- සමාගමෙන් ඔවුන් ස්වාධීනව ඇති බව සමාගමේ කළමනාකාරිත්වය පිළිබඳව බාහිර විගණකවරුන් සමග සාකච්ඡාව
- ව්‍යවස්ථාපිත වාර්තාකරණය සහ ගෙවීම් අවශ්‍යතා සමග අනුකූලවීමේ වාර්තාව සමාලෝචනය

- බාහිර විගණනයේ සඵලත්වය පිළිබඳව කමිටුව සමාලෝචනය කළ අතර වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස්හිමියන්ගේ අනුමැතිය ලැබීමට යටත්ව, බී. ඒ. ද සිල්වා, වරලත් ගණකාධිකාරීවරු, සමාගමේ බාහිර විගණකවරුන් ලෙස එළඹෙන වසර සඳහා නැවත පත්කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත ප්‍රකාශයෙහි දක්වා තිබේ. 2007 අංක 7 දරන සමාගම් පනතෙහි විධිවිධාන ප්‍රකාරව පිළියෙල කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශයන්ට අදාළව විගණකවරුන්ගේ වගකීම විගණන වාර්තාවේ දක්වා තිබේ.

මූල්‍ය ප්‍රකාශ සමන්විත වනුයේ,

(අ) මුදල් වර්ෂය අවසානයේදී සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත් කරන ශේෂ පත්‍රය සහ

(ආ)මුදල් වර්ෂය සඳහා සමාගමේ ලාභ සහ අලාභ පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කරන සමාගමේ ආදායම් ප්‍රකාශනය යන ප්‍රකාශයන්ගෙනි.

මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ,

අ. සංගත ආකාරයෙන් තෝරාගෙන සහ ආදේශ කර ඇති යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ යම් ද්‍රව්‍යමය බැහැරවීමක් වේ නම් එය අනාවරණය කරමින් සහ විස්තර කරමින්, සහ

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින්, සහ

ඇ. ගනුදෙනුවල ස්වරූපය සහ භාවාර්ථය නිසි අයුරින් පිලිබිඹු වන පරිදි සාධාරණ සහ ඥාණාන්විත තීන්දු සහ ඇස්තමේන්තු සිදු කරමින්, සහ

ඈ. සමාගම් පනත අනුව අවශ්‍ය තොරතුරු සපයමින් ය.

එසේම, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රවර්තන ව්‍යාපාර පදනම ආදේශ කිරීම සාධාරණීකරණය කරමින් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතුව පවතින බව අධ්‍යක්ෂවරුන් සබහතික කිරීමද අවශ්‍ය වේ.

තවද, සමාගමේ මූල්‍ය තත්ත්වය, සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව හෙළිදරව් කිරීම පිණිස ප්‍රමාණවත් ගිණුම් වාර්තා සමාගම පවත්වාගෙන යනු ලබන බව සහතික කිරීමටද අධ්‍යක්ෂවරුන්ට වගකීමක් තිබේ.

ඊට අමතරව, වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීමේ සහ සොයා ගැනීමේ අරමුණු ඇතිව යෝග්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම පිහිටුවීම මගින් සමාගමේ වත්කම් ආරක්ෂා කරගැනීමට සාධාරණ ක්‍රියා මාර්ග ගැනීමෙහිලා අධ්‍යක්ෂවරු වගකිව යුතු වෙති.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමටත්, විගණකවරුන්ට සිය විගණන මතය ඉදිරිපත් කිරීමට හැකියාව ලබා දෙනු ඇතැයි ඔවුන් සලකනු ලබන ඕනෑම පියවර ගැනීමට සහ ඕනෑම පරීක්ෂණයක් පැවැත්වීමට හැකි සෑම සහායක්ම අධ්‍යක්ෂවරුන් සැපයිය යුතුය. මෙම ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි තම වගකීම් නිසි අන්දමින් ඉටු කර ඇති බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වේ.

අනුකූලතා වාර්තාව

සිය උපරිම දැනුම අනුව සමාගම විසින් ගෙවිය යුතු සියලු බදු, තීරු බදු සහ අයබදු, සමාගමේ සියලු සේවකයන් වෙනුවෙන් සහ අදාළව ගෙවිය යුතු සියලු දායක මුදල් අයබදු සහ බදු සහ ශේෂපත්‍ර දිනට සමාගම විසින් ගෙවිය යුතු සහ ගෙවීමට නියමිතව තිබූ අනෙකුත් සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා ඇති බව අධ්‍යක්ෂකවරු සනාථ කරයි.

බී. ආර්. ද සිල්වා සහ සමාගම
වරලත් ගණකාධිකාරිවරු

පුද්ගලිකයි රහසිගතයි

<u>සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජිස් සමාගමේ සාමාජිකයන් වෙත ඉදිරිපත් කරන ස්වාධීන විගණන වාර්තාව</u>

1. <u>මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව</u>

2011 මාර්තු 31 දිනට ශේෂපත්‍රය සහ ආදායම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා අයිතිය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන් වලින් සමන්විත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජිස් සමාගමෙහි, මේ සමග ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

2. <u>මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමනාකාරිත්වයේ වගකීම</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ හා සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකාරිත්වය සතු වේ. එසේම වංචා හෝවැරදි හේතුවෙන් සිදුවන ද්‍රව්‍යමය දූෂ්ප්‍රකාශ වලින් තොරව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට සහ සාධාරණ අන්දමින් ඉදිරිපත් කරීමට අදාළ අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීම සහ අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සැදීම මෙම වගකීමට අයත් වේ.

3. <u>විගණනයේ විෂයපථය සහ මතය ප්‍රකාශ කිරීමේ පදනම</u>

අපේ වගකීම වනුයේ අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අපගේ මතය ප්‍රකාශ කිරීමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපගේ විගණනය සිදු කළෙමු. මූල්‍ය ප්‍රකාශ, ද්‍රව්‍යමය දූෂ්පක්‍රාශයන්ගෙන් තොර ද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කිරීම මෙම ප්‍රමිතින් අනුව අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් මුදල් ප්‍රමාණ සහ අනාවරණය කිරීම් තහවුරු කරන පරීක්ෂණ පදනම් සාක්ෂි පරීක්ෂා කිරීම විගණනයට අයත් වේ. එසේම යොදාගත් ගිණුම්කරණ මූලධර්ම සහ කළමනාකරණය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීමට මෙන්ම සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

එබැවින්, අපගේ මතය සඳහා සාධාරණ පදනමක් අපගේ විගණනය සපයන බව අපගේ විශ්වාසයයි.

(4) <u>මතය</u>

අපගේ මතය අනුව, , සමාගම විසින් 2011 මාර්තු 31 දිනෙන් වඅසන් වන වර්ෂය සඳහා නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශ මගින් සමාගමේ කටයුතු පිළිබඳව සහ එදින අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභ සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ලබා දෙයි.

(5) <u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 (2) වගන්තියේ අවශ්‍යතා සමග ද අනුකූල වේ.

බී. ආර්. ද සිල්වා සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
කොළඹ 05.

දිනය : 2011/09/13

සීමාසහිත ලංකා ලොජිස්ටික්න් සහ ටෙක්නොලොජීස් සමාගම

ආදායම් ප්‍රකාශය

2011 මාර්තු 31 දායින් අවසන් වසර සඳහා			2009/2010
	සටහන්	රු. ශත	රු. ශත
ආදායම	(3)	46,091,096.60	40,706,635.21
විකුණුම් පිරිවැය		(12,416,330.54)	(33,977,382.45)
දළ ලාභය		33,674,766.06	6,729,252.76
අනෙකුත් මෙහෙයුම් ආදායම	(4)	9,046,617.65	12,011,472.00
පෙර වසරෙහි වැඩිපුර සැපයූ ව්‍යාපෘති වියදම		6,776,979.55	22,220,361.97-
		49,498,363.26	40,961,086.93
පරිපාලන වියදම		(38,494,455.05)	(36,039,754.62)
මෙහෙයුම් ලාභ	(5)	11,003,908.21	4,921,332.31
මූල්‍ය පිරිවැය	(6)	(178,743.49)	(113,844.76)
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලාභය / (අලාභය) - බදුවලට පෙර		10,825,164.72	4,807,487.55
බදු ගෙවීම්		(3,176,218.77)	(2,771,823.00)
බදුවලට පසු වලින් ශුද්ධ ලාභය/(අලාභය)		7,648,945.95	2,035,664.55
කොටසකට ඉපැයුම් - මූලික	(7)	37,311.93	9,930.07

<u>සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම</u>

2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය

වත්කම්	**සටහන්**	රු.	2010.03.31 ශත රු.
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	(8)	4,030,340.19	8,433,647.65
		4,030,340.19	8,433,647.65
<u>ජංගම වත්කම්</u>			
ආයෝජන	(9)	72,883,767.43	72,465,385.04
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	(10)	53,291,717.03	59,477,943.12
අයකර ගත යුතු ආදායම් බදු	(11)	6,330,075.54	5,214,783.49
මුදල් සහ මුදලට සමාන දෑ	(12)	110,909.02	835,748.08
		132,616,469.12	137,993,859.73
මුළු වත්කම්		**136,646,809.31**	**146,427,507.38**
<u>ස්කන්ධ සහ බැරකම්</u>			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(13)	2,050.00	2,050.00
මූලික ප්‍රාග්ධනය	(14)	100,000,000 .00	100,000,000.00
සමුච්චිත ලාභය / (අලාභය)		945,171.42	(6,703,774.53)
මුළු ස්කන්ධ		**100,947,221.42**	**93,928,275.47**
<u>ජංගම නොවන බැරකම්</u>			
පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන	(15)	1,870,425.00	1,331,562.50
<u>ජංගම බැරකම්</u>			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	(16)	22,657,326.90	48,053,389.78
ලංකා බැංකුව ගි.අ. 5960696		11,171,835.99	3,744,279.63
		33,829,162,89	51,797,669.41
මුළු ස්කන්ධ සහ බැරකම්		**136,646,809.31**	**146,427,507.38**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා හා අනුකූල වේ.

මූල්‍ය ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කරනු ලැබුයේ,

	අත්සන	නම
අධ්‍යක්ෂවරු :	1.	පී.ඒ.අයි.සිරිනිමල් පෙරේරා
	2.	ඩබ්. ඒකනායක

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්
අනුමත කළ දිනය 2011.09.13

පිටු අංක 05 සිට 16 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේම අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජිස් සමාගම

අයිතිය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2011 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. ශත	මූලික ප්‍රාග්ධනය රු. ශත	සමුච්චිත ලාභය / (අලාභය) රු. ශත	එකතුව රු. ශත
2009 මාර්තු 31 දිනට ශේෂය	2,050.00	100,000,000.00	(3,000,719.95)	97,001,330.05
පෙර වසර සඳහා ගැලපුම්(සටහන 18)		-	(5,738,719.13)	(5,738,719.13)
වසර සඳහා ලාභය			2,035,664.55	2,035,664.55
2010 මාර්තු 31 දිනට ශේෂය	2,050	100,000,000	(6,703,774.53)	93,298,275.47
වසර සඳහා ලාභය	-	-	7,648,945.95	7,648,945.95
2011 මාර්තු 31 දිනට ශේෂය	2,050	100,000,000	945,171.42	100,947,221.42

ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2011 මාර්තු 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා

		2007/2008
	රු.	රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
ආදායම් බදු වියදම්වලට පෙර සහ අති විශේෂ අයිතමයන්ගෙන් ශුද්ධ ලාභය	10,825,165	4,807,488
ගැලපීම්		
ක්ෂය වීම්	4,478,215	4,444,080
මූල්‍ය පිරිවැය	188,094	113,845
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	538,863	569,313
ලැබූ පොලිය	(9,046,618)	(11,946,331)
කාරක ප්‍රාග්ධන වෙනසකට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)	6,983,718	(2,011,605)
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු (වැඩිවීම) / අඩුවීම	5,949,976	(1,723,375)
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම)	(25,396,063)	(37,778,782)
මෙහෙයුම් වලින් උත්පාදිත මුදල්	(12,462,368)	(41,513,762)
ගෙවනු ලැබූ මූල්‍ය වියදම්	(188,094)	(113,845)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල්	(12,650,462)	(41,627607)
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
දේපල, පිරියත සහ උපකරණ අත් කර ගැනීම	(74,908)	(2,251,089)
ලැබුණු පොලිය	9,046,618	12,011,472
ආයෝජන අත් කර ගැනීම	(4,473,643)	(30,887,567)
ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	4,498,066	40,647,950
මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	(8,152,395)	(1,044,798)
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ	**(2,908,532)**	**(1,863,734)**
වර්ෂය අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ	**(11,060,927)**	**(2,908,532)**
මුදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය		
බැංකුවේ ඇති මුදල් - (අයිරාව)	(11,171,836)	(3,744,280)
බැංකුවේ ඇති මුදල් -ගි.අ.5960160	66,659	835,748
සම්පත් බැංකුව	24,250	
අතැති මුදල්	20,000	
	(11,060,927)	(2,908,532)

ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2011 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා

1. ආයතනික තොරතුරු

1.1 පොදු

සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම ("සමාගම") ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ සහ එහි නිත්‍ය වාසය ඇති ආධිනතා සීමාසහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 4–205 හි වන අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම ස්ථානයේම පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වසර තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව සහ පොලිසිය සඳහා උපකරණ සහ සේවා ප්‍රසම්පාදනයයි.

1.3 පිටු අංක (5) සිට (16) දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි.

1.4 සේවක සංඛ්‍යාව

වසර අවසානයේදී සේවක සංඛ්‍යාව 21 ක් විය.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 සාමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 පිළියෙල කිරීමේ පදනම

2011 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, අයිතිය වෙනස්වීම සහ මුදල් ප්‍රවාහය සමගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශ) ශ්‍රී ලංකාවේ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සමග හැකි සෑම ආකාරයකින්ම අනුකූල වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමින් ඉදිරිපත් කර ඇත

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් සිදු කර ඇති අතර ඇවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

2.1.2 සන්සන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව ආදේශ කර තිබේ.

2.1.3 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තන

සියලු විදේශ විනිමය ගනුදෙනු, ගනුදෙනු කළ දිනයන්ට අදාළ විනිමය අනුපාතයෙන් වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදලින් අභිධාන කර ඇති මුදල් වත්කම් සහ බැරකම් වසර අවසානයේ පවතින විදේශ විනිමය අනුපාතය භාවිතා කරමින් ශ්‍රී ලංකා රුපියල් වලින් සමාන මුදලට පරිවර්තනය කරනු ලැබේ. මුදල් නොවන වත්කම් සහ බැරකම්, වටිනාකම් නිශ්චය කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදාගනිමින් පරිවර්තනය කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ සඳහා ආදායම් ප්‍රකාශයේ හේතු දක්වා ඇත.

2.1.4 බදුකරණය

(අ) ජංගම බදු

ආදායම් බදු ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ, මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කර ඇති පරිදි සහ දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇති ආදායම් සහ වියදම් මූලිකාංග මතය.

2.1.5 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය, ඒවා දරන ලද කාලසීමාවේ වියදමක් සේ පිළිගනු ලැබේ.

2.1.6 විලම්භිත වියදම්

එක් මූල්‍ය වර්ෂයකට වැඩි ප්‍රමාණයකට ප්‍රතිලාභය හෝ සබඳතාවක් ඇති යැයි සලකනු ලබන වියදම් විලම්භිත වියදම් ලෙස වර්ගීකරණය කර තිබේ. එබඳු වියදම් සරල රේඛීය පදනමින් එය අදාල වන කාල සීමාවෙන් කපා හරිනු ලැබේ.

2.2 වත්කම් තක්සේරුව සහ ඒවායේ මැනුම් පදනම්

2.2.1 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වල මුළු ප්‍රමාණය උපලබ්ධි කිරීමට ඒවා ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන්ගෙන් වෙළඳ ලැබිය යුතු දෑ සටහන් කර තිබේ.

2.2.2 මුදල් හා සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අර්ථ දක්වා ඇත්තේ දන්නා ලද මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්ත්‍ය සහ වටිනාකම වෙනස්වීමේ නොසැලකිය හැකි අවදානමක් සහිත අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ලෙස ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් සහ නොගෙවූ බැංකු අයිරාවලින් ශුද්ධ වූ බැංකු තැන්පතු වලින් සමන්විත වේ. කෙටි කල්පිරීම් සහිත ආයෝජන, එනම් අත් කරගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන ද මුදලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.

2.2.3 දේපල, පිරියත සහ උපකරණ

(අ) පිරිවැය

දේපල, පිරියත හා උපකරණ වාර්තා කරනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයටය.

(ආ) පිරිවැය සහ තක්සේරුව

සියලු දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් මුලින්ම පිරිවැය අනුව සටහන් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ අයිතම පසුව ප්‍රත්‍යාගණනය කිරීමේදී, එබඳු වත්කම්වල සමස්ත පංතියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ශේෂ පත්‍ර දිනයට, ඒවායේ ධාරණ මුදල් ප්‍රමාණයන් ඒවායේ සාධාරණ වටිනාකමින් ද්‍රව්‍යමය ලෙස වෙනස් නොවන බවට වග බලාගැනීම සඳහා ප්‍රමාණවත් සව්ධිතාවකින් ප්‍රත්‍යාගණන සිදු කරනු ලැබේ. පිරිවැය අනුව වටිනාකම තක්සේරු කළ වත්කමක් ලෙස පළමුව පිළිගැනීමෙන් පසු, ප්‍රතිතක්සේරු කරනු ලැබූ දේපල, පිරියත හා උපකරණ ඒවායේ තදනන්තර ක්ෂයවීම් අඩු කර ප්‍රතිතක්සේරු කළ මුදල් ප්‍රමාණයට පවත්වාගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපල, පිරියත සහ උපකරණ ක්ෂයවීම් අඩු කර ඓතිහාසික පිරිවැයට සඳහන් කරනු ලැබේ.

(ඈ) <u>පුනස්ථාපන පිරිවැය</u>

මුලින්ම තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීමට හෝ නඩත්තු කිරීමට දරන ලද වියදම, එලෙස වියදම දැරූ අවස්ථාවේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

(ඈ) <u>ක්ෂයවීම්</u>

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනය ගණනය කර ඇත්තේ සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ වටිනාකම මත සරල රේඛීය පදනම යොදාගනිමිනි. යොදාගත් ප්‍රධාන වාර්ෂික අනුපාත වනුයේ :

ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	20%
කාර්යාල උපකරණ	20%
මෝටර් රථ වාහන	25%
තො. තා. උපකරණ සහ උපාංග	25%
අභ්‍යන්තර අලංකරණ	50%

ප්‍රතිශෝධිත ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18: දේපල, පිරියත සහ උපකරණ ඒවා භාවිතා කිරීමට ඉතිරිව ඇති කාලසීමාව මත ක්ෂයවීම් සපයා තිබේ.

2.2.4 <u>කල්බදු</u>

(අ) <u>මූල්‍ය කල්බදු - සමාගම බදුගන්නා වූ විට</u>

බදු අයිතමවල හිමිකාරිත්වයට ආනුෂංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු අන්දමින් සමාගමට සඵල ලෙස පවරන මූල්‍ය බදු මත වන දේපල, පිරියත සහ උපකරණ ඒවායේ මුදල්මය වටිනාකමට අනුව ප්‍රාග්ධන ගත කර දේපල, පිරියත සහ උපකරණ ලෙස අනාවරණය කර එම බදු වත්කමේ භාවිතයෙන් ප්‍රතිලාභ ලැබීමට සමාගම අපේක්ෂා කරන කාලසීමාව සඳහා ක්ෂය කරනු ලැබේ.

බදු දෙන්නාට ගෙවිය යුතු අනුරූපී මුල් මුදල බැරකමක් ලෙස දැක්වේ. බැරකමේ ඉතිරිව පවතින ශේෂය මත ස්ථායී පොලී අනුපාතයක් ඇති කරගැනීමට හැකි වනු පිණිස කල්බදු ගෙවීම් මූල්‍ය ගාස්තු සහ කල්බදු බැරකමෙහි අඩුවීම අතර බෙදා වෙන් කරනු ලැබේ. බදු කාලය තුළ ගෙවිය යුතු පොලිය අවිනිශ්චිත ගිණුමෙහි පොලියකට පවරනු ලැබේ. එක් එක් මුදල් වර්ෂය සඳහා අදාළ වන්නා වූ කුලී බැඳීම් වල පොලිය, බදු කාලය තුළ ආදායම් ප්‍රකාශයට අය කරනු ලැබේ.

(ආ) <u>මෙහෙයුම් කල්බදු</u>

කල්බදුකරු බදු කාලය පුරා හිමිකාරිත්වයෙහි අවදානම් සහ ප්‍රතිලාභ සත්තාවත්ව සඵලව රඳවා තබා ගන්නා කල්බදු, මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කෙරේ.

මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන කුලී මුදල්, ආදායම් ප්‍රකාශයෙහි වියදමක් ලෙස පිළිගනු ලැබේ.

2.2.5 ආයෝජන

(අ) ජංගම ආයෝජන

ජංගම ආයෝජන පිරිවැයට වඩා අඩුවෙන් වෙළඳපොල වටිනාකමින් දක්වනු ලැබේ.

ආයෝජනයක පිරිවැය යනු බ්‍රෝකර් ගාස්තු, තීරුබදු සහ බැංකු ගාස්තු ඇතුළුව ප්‍රතිග්‍රහණය සඳහා වන පිරිවැයයි.

(ආ) දිගුකාලීන ආයෝජන

දිගුකාලීන ආයෝජන පිරිවැය හෝ තක්සේරුව හෝ පැතිකඩ පදනමින් පිරිවැය සහ වෙළඳපොල වටිනාකමට අඩුවෙන් දැක්වේ.

ආයෝජන පිරිවැය යනු බ්‍රෝකර් ගාස්තු, තීරු බදු සහ බැංකු ගාස්තු ඇතුලත්ව ප්‍රතිග්‍රහණය සඳහා වන පිරිවැයයි.

2.3 <u>බැරකම් සහ ප්‍රතිපාදන</u>

2.3.1 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත.

2.3.2 <u>විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්</u>

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

පාරිතෝෂිකය යනු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. මෙම බැරකම ඉටු කරනු වස්, පළමු සේවා වසරින් ආරම්භ වී සම්පූර්ණ කර ඇති සේවය කරන ලද සෑම වසරක් සඳහාම සියලු සේවකයන්ට, මූල්‍ය වසරේ අවසන් මාසයේ අර්ධ මාසික වැටුප පාදකව ශේෂ පත්‍රයේ වෙන් කිරීමක් ඉදිරියට ගෙන යනු ලැබේ.

පාරිතෝෂික බැරකම බාහිරව අරමුදල් සපයන්නක් හෝ උපචිත ලෙස තක්සේරු කරන්නක් නොවේ. මෙම අයිතමය ශේෂපත්‍රයේ ප්‍රතිපාදන සහ අනෙකුත් බැරකම් යටතේ කාණ්ඩ කර තිබේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව සේවකයින්, සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් වලට සුදුසුකම් ලබයි.

2.4 ප්‍රදාන සහ සහනාධාර

ප්‍රදානය / සහනාධාරය ලැබෙන බවට සාධාරණ සහතිකයක් තිබේ නම් සහ සම්බන්ධිත සියලු කොන්දේසි, කිසිවක් හෝ තිබේනම්, ඒවාට අනුකූලව කටයුතු කරන්නේ නම් ප්‍රදාන සහ සහනාධාර ඒවායේ සාධාරණ වටිනාකම මත පිළිගනු ලැබේ. ප්‍රදානය හෝ සහනාධාරය වියදම් අයිතමයකට අදාල වන විටකදී, ක්‍රමවත් පදනමකින් එය හානිපූරණය කිරීමට අපේක්ෂා කරනු ලබන පිරිවැයට ඒවා ගැලපීමට අවශ්‍ය කාලසීමාව පුරා ආදායමක් ලෙස එය පිළිගනු ලැබේ.

සාධාරණ වටිනාකම් ඇති මුදල් නොවන ප්‍රදානයන් ඇතුළුව වත්කම්වලට අදාළ ප්‍රදාන සහ සහනාධාර, වත්කමෙහි ධාරණ වටිනාකමට පැමිණි විටදී අඩු කරනු ලැබේ.

2.5 ආදායම් ප්‍රකාශ

2.5.1 ආදායම් පිළිගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ප්‍රවාහය වීමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද හෝ දැරීමට නියමිත ආදායම ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම පිළිගනු ලැබේ. ආදායම මනිනු ලබන්නේ වෙළඳ මට්ටම සහ විකුණුම් බදුවලින් ශුද්ධ වූ ලැබුණු හෝ ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමටය. ආදායම් පිළිගැනීමේ කාර්යය සඳහා පහත දැක්වෙන නිශ්චිත නිර්ණායක යොදාගනු ලැබේ.

(අ) භාණ්ඩ අලෙවිය

හිමිකාරිත්වය හා සාමණයෙන් සබැඳුණු ප්‍රමාණයට අඛණ්ඩ කළමනාකාරිත්ව මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ පිළිබඳ සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගන්නා විට හා භාණ්ඩවල හිමිකාරත්වයේ සැලකිය යුතු අවදානම් සහ පරිදාන ගැනුම්කරුට පවරා ඇති විටදී භාණ්ඩ විකණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලැබේ.

(ආ) සේවාවන් සැපයීම

සේවාවන් සැපයීමෙන් ලැබෙන ආදායම, එම සේවාවන් සැපයූ හෝ ඉටු කළ ගිණුම්කරණ කාලසීමාව තුළදී පිළිගනු ලැබේ.

(ඇ) <u>පොලිය</u>

පොලී ආදායම උපචිත පදනමින් පිළිගනු ලැබේ.

(ඈ) <u>කුලී ආදායම</u>

කුලී ආදායම උපචිත පදනමින් පිළිගනු ලැබේ.

(ඉ) <u>අනිකුත්</u>

අනිකුත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

දේපළ, පිරියත උපකරණ සහ ආයෝජන ඇතුළු අනෙකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, බැහැර කිරීම් මත උත්පාදන වත්කම් වල ධාරණ මුදල් ප්‍රමාණය සහ ආශ්‍රිත විකුණුම් වියදම් වලින් අඩුකිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත (ප්‍රත්‍යාගණනය කරන ලද දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේදී, වත්කමට අදාලව ප්‍රත්‍යාගණන සංචිතයේ ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය, ඍජුවම සමුච්චිත ලාභයට මාරු කරනු ලැබේ.)

<u>2.5.2 වියදම් පිළිගැනීම</u>

(අ) ආදායම් ප්‍රකාශයේ වියදම් පිළිගනු ලබන්නේ දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමවල ඉපැයුම් අතර ඍජු සම්බන්ධය පදනම් කරගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාමට දැරීමට සිදු වූ සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

(ආ) ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ මන්ඩලයේ අදහස වනුයේ 'වියදමේ ශ්‍රිතය' ක්‍රමය සමාගමේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණව ඉදිරිපත් කරන බවය. එබැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය යොදා ගෙන තිබේ.

ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2011 මාර්තු 31 දිනෙන් අවසන් වසරසඳහා 2009/2010

(3)	**ආදායම**	**රු. ශත**	**රු. ශත**
	ප.ස.ම ව්‍යාපෘති සේවා ගාස්තුව	13,213,868.44	40,706,635.21
	පරිපාලන ගාස්තු	31,894,826.87	
	ලියාපදිංචි ගාස්තු-සැපයුම්	982,401.29	
		46,091,096.60	11,946,331.22
(4)	**අනෙකුත් මෙහෙයුම් ආදායම**		
	පොළී ආදායම්-ස්ථාවර තැන්පතු	8,666,011.72	11,946,331.22
	පොළී ආදායම්-ඉතුරුම්	349,085.93	65,140.00
	විවිධ ආදායම්	31,520.00	
		9,046,617.68	12,011,472.20

(5) මෙහෙයුම් ලාභය සඳහන් කර ඇත්තේ පහත දැක්වෙන ඒවා ඇතුළුව සියලුම වියදම් අය කිරීමෙන් පසුවය.

වැටුප්	16,636,501,68	15,475,291.66
විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය (ගාස්තු සහ වියදම්)	107,100.00	95,000.00
කාර්ය මණ්ඩල පිරිවැය (පහත දැක්වෙන විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් වියදම් ඇතුලුව)		
නිශ්චිත දායක මුදල් පිරිවැය සැලසුම් -පාරිතෝෂික	538,862.50	569,312.50
නිශ්චිත දායක මුදල් සැලසුම් පිරිවැය - සේ.අ.අ සහ සේ.හා.අ	2,503,338.25	2,321,293.75

(6)	**මූල්‍ය පිරිවැය**		
	බැංකු ගාස්තු	13,810	12,260.00
	හර බද්ද	127,676.86	54,563.53
	අයිරා පොලිය	37,256.63	47,021,23
		178,743.49	113,844,76

(7) කොටසකට ඉපැයුම

කොටසකට ඉපැයුම් ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණීය වසරේ ශුද්ධ ලාභය වසර තුළ සාමාන්‍ය කොටස් වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙනි.

		2009/2010
සාමාන්‍ය කොටස්වලට ආරෝපණීය ශුද්ධ ලාභය (රු.)	7,648,945.95	2,035.664.55
වසර තුළ නොගෙවූ බර තැබූ කොටස් සාමාන්‍ය සංඛ්‍යාව	205	205
කොටසකට ඉපැයුම්	37,311.93	9,930.07

(8) දේපල, පිරියත සහ උපකරණ

(8.1) දළ ධාරණ මුදල් ප්‍රමාණය	*2010.04.01 දිනට ශේෂය*	*එකතු කිරීම් මාරුකිරීම්*	*බැහර කිරීම්/ මාරුකිරීම්*	*2011.03.31 දිනට ශේෂය*
	රු. ශත	*රු. ශත*	*රු.ශත*	*රු.ශත*
මෝටර් රථ	8,778,061.46	-	-	8,778,061.46
අභ්‍යන්තර අලංකරණය	4,321,487.05	33,597.80	-	4,355,084.85
පරිගණක සහ උපාංග	3,204,813.39	-	-	3,204,818.39
ගෘහභාණ්ඩ සහ උපාංග	2,321,327.85	30,275.30	-	2,351,603.15
කාර්යාල උපකරණ	1,795,774.31	11,034.68	-	1,806,808.99
	20,421,469.06	74,907.78	-	20,496,376.84

(8.2) ක්ෂයවීම්

මෝටර් රථ	4,387,011.40	2,193,929.00	-	6,580,940.40
අභ්‍යන්තර අලංකරණය	3,618,180.84	708,000.70	-	4,326,181.54
පරිගණක සහ උපාංග	1,947,659.20	744,970.81	-	2,692,630.01
ගෘහභාණ්ඩ සහ උපාංග	1,307,003.78	511,517.84	-	1,818,521.62
කාර්යාල උපකරණ	727,966.19	319,796.89	-	1,047,763.08
	11,987821.41	4,478,215.24	-	16,466,036.65

(8.3) ශු.පො.ව.	2010/2011	2009/2010
	රු.ශත	රු.ශත
පිරිවැයට	4,030,340.19	8,433,647.65
දේපල, පිරියත සහ උපකරණවලට මුලුධාරණ මුදල්	4,030,340.19	8,433,647.65

(9) ආයෝජන

භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය	24,999,999.63	28,617,926.68
ස්ථාවර තැන්පතු වල ආයෝජනය	47,883,767.80	43,847,458.38
	72,883,767.43	72,465,385.04

රු. 37,883,767 ක මුදලක් සහිත අංක 7013173 දරන ලංකා බැංකුවේ කාල තැන්පතු සහතිකය රු. 34,000,000.00 ක අයිරා පහසුකම සඳහා ඇපයක් ලෙස බැංකුව රඳවා ගනු ලැබ තිබේ.

(10) වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ ණයගැතියෝ	18,559,632.72	36,377,060.68
අනිකුත් ණයගැතියෝ	34,707,068.15	23,100,882.44
පූර්ව ගෙවීම් තැන්පතු	25,016.26	
	53,291,717.13	59,477,943.12

(11) ලැබිය යුතු ආදායම් බදු

වර්ෂය ආරම්භයේදී ශේෂය	5,214,783.49	5,902,643.14
වසර සඳහා ප්‍රතිපාදන	(3,176,218.77)	(2,771,823.00)
	2,038,564.72	2,320,820.14
එකතුකළා: ගෙවීම්	4,291,510.82	2,893,963.35
වර්ෂය අවසානයෙදී ශේෂය	6,330,075.54	5,214,783.49

(12) මුදල් හා මුදලට සමාන දෑ

ලංකා බැංකුව	66,659.00	815,748.08
සම්පත් බැංකුව	24,250	-
අතැති මුදල්	19,999.99	20,000.00
	110,909.02	835,748.08

(13) ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රකාශිත ප්‍රාග්ධනය	2,050.00	2,050.00

(14) මූලික ප්‍රාග්ධනය **100,000,000.00** **100,000,000.00**

සටහන : මූලික ප්‍රාග්ධනය සපයනු ලැබුයේ යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව විසිනි.

(15) පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ආරම්භක ශේෂය	1,331,562.50	762,250.00
වසර සඳහා ප්‍රතිපාදනය	538,862.50	569,312.00
අවසන් ශේෂය	1,870,425.00	1,331,562.50

(16) වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ

වෙළඳ ණයගැතියෝ	14,871,779.60	42,756,065.50
උපචිත වියදම් සහ අනෙකුත් ණයගැතියෝ	7,785,547.30	5,297,324.28
	22,657,326.90	48,053,389.78